සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දේවි බාලිකා විද්‍යාලය - කොළඹ

# DEVI BALIKA VIDYALAYA - COLOMBO

III වාර පරීක්ෂණය - 2021 දෙසැම්බර්

13 ශ්‍රේණිය

ආර්ථික විද්‍යාව I
Economics I

21 S I

පැය දෙකයි
Two hours

උපදෙස්
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 50 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා හිස්තැනට අදාළ අංකය ලියන්න.

01. ආර්ථික විද්‍යා අර්ථකථනය අනුව "ආර්ථික සම්පතක්" යන්න විස්තර කළ හැක්කේ,
1. නිෂ්පාදන ක්‍රියාවලියේදී ආධාර කරගනු ලබන ඕනෑම දෙයක් වශයෙනි.
2. ප්‍රතිශ්ඨාපනය කළ නොහැකි සාපේක්ෂව හිඟ සම්පතක් වශයෙනි.
3. පෞද්ගලික අංශය විසින් සපයන හිඟ සම්පතක් වශයෙනි.
4. මිනිස් වුවමනාවලට සාපේක්ෂව ප්‍රමාණවත් සැපයුමක් නැති ධන ආවස්ථික පිරිවැයක් සහිත භාණ්ඩයක් වශයෙනි.
5. වැඩිවම ආවස්ථික පිරිවැයක් සහිත මිලක් නියම වී ඇති ස්වාභාවික සම්පතක් වශයෙනි. (......)

02. කිසියම් ආර්ථික භාණ්ඩයක ආවස්ථික පිරිවැය ශුන්‍ය විය හැක්කේ,
1. හිඟ සම්පත් භාවිත නොකොට භාණ්ඩය නිෂ්පාදනය කර ඇති විටය.
2. විකල්ප භාවිත නොමැති සම්පත් භාවිත කොට භාණ්ඩය නිෂ්පාදනය කර ඇති විටය.
3. අදාළ භාණ්ඩය අකාර්යක්ෂමව භාවිත කරන විටය.
4. පාරිභෝගිකයාට එම භාණ්ඩය නොමිලේ හිමිවන විටය.
5. අදාළ භාණ්ඩය සුවිශේෂී භාවිතයන් පමණක් පවතින විටය. (......)

03. නිෂ්පාදන හැකියා මායිම මත A ආර්ථිකයේ තෝරා ගැනීම "A" ලක්ෂ්‍යය මගින් ද B ආර්ථිකයේ තෝරා ගැනීම "B" ලක්ෂ්‍යය මගින් දැක්වේ. අනෙකුත් කරුණු ස්ථාවරව පවතින්නේ නම් පහත සඳහන් කවරක් වඩාත් නිවැරදි වේද?




1. අනාගතයේදී A ආර්ථිකයේ නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන් වුව ද B ආර්ථිකයේ නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන් නොවේ.
2. අනාගතයේදී රටවල් දෙකේම නිෂ්පාදන හැකියා වක්‍රය දකුණට විතැන්වේ.
3. ආර්ථිකයේ අනාගත වෘද්ධි වේගයට වඩා B ආර්ථිකයේ අනාගත වෘද්ධි වේගය අඩුවනු ඇත.
4. A ආර්ථිකයේ අනාගත වෘද්ධි වේගයට වඩා B ආර්ථිකයේ අනාගත වෘද්ධි වේගය වැඩි වනු ඇත.
5. අනාගත වෘද්ධි තත්වයන් රටවල් දෙකෙහිම අවිනිශ්චිත වනු ඇත. (......)

04. පහත දක්වෙන ඉල්ලුම් රේඛාව හා සම්බන්ධ වන නිවැරදි ප්‍රකාශය වන්නේ,




1. C ලක්ෂයේදී නම්‍යතාවය 0 කි.
2. B ලක්ෂයේදී නම්‍යතාවය අනම්‍ය වේ.
3. B ලක්ෂයේදී නම්‍යතාව -2.5 කි.
4. A ලක්ෂයට පහළින් කලාපයේ නම්‍යතාවය 1ට අඩු වේ.
5. A ලක්ෂයත් D ලක්ෂයත් අතර කලාපයේ නම්‍යතාවය 1 - 0 අතර වේ.

(......)

05. සෘණ සිරස් අන්තඛණ්ඩයකින් ආරම්භ වී වමේ සිට දකුණට ඉහළ නගින සැපයුම් වක්‍රයක මිල නම්‍යතාව සම්බන්ධව කුමන ප්‍රකාශය සත්‍ය වේද?
1. නම්‍යතා සංගුණකය 1 ට වඩා වැඩිවේ. වක්‍රයේ ඉහළ ලක්ෂ්‍යයන්හිදී එහි අගය අඩුවේ.
2. නම්‍යතා සංගුණකය සෑම ලක්ෂ්‍යයකදීම ඒකීය වේ.
3. නම්‍යතා සංගුණකය 1 ට වඩා අඩුවේ. වක්‍රයේ ඉහළ ලක්ෂයන්හදී එහි අගය අඩුවේ.
4. නම්‍යතා සංගුණකය 1 ට වඩා අඩුවේ. වක්‍රයේ ඉහළ ලක්ෂයන්හිදී එහි අගය වැඩිවේ.
5. සෑම ලක්ෂයකම නම්‍යතා සංගුණකය 0 ක් වේ. (......)

06. පහත අවස්ථා අතරින් ආයතනයක මුළු නිෂ්පාදන අයභාරය වැඩිවන්නේ කවර අවස්ථාවකදී ද?
1. ඉල්ලුම ඒකීය නම්‍ය තත්වයක දී මිල ඉහළ යන විට
2. ඉල්ලුම අනම්‍ය තත්වයක දී මිල පහළ යන විට
3. ඉල්ලුම අනම්‍ය තත්වයකදී මිල ඉහල යන විට
4. ඉල්ලුම නම්‍ය තත්වය දී මිල ඉහළ යන විට
5. ඉල්ලුම පූර්ණ අනම්‍ය තත්වයකදී මිල පහළ යන විට (......)

07. එක්තරා භාණ්ඩයක මිල ඉල්ලුම් නම්‍යතාවය -0.3 ක් සහ සැපයුම් නම්‍යතාව 0.5 ක් වන භාණ්ඩයක් මත ඒකක බද්දක් පැනවුවහොත්
1. අඩු ප්‍රතිශතයකින් මිල ඉහළ යයි.
2. නිෂ්පාදකයා වැඩි ඒකක බදු බරක් දරනු ලබයි.
3. ඒකක බද්දෙන් වැඩි ප්‍රතිශතයකින් මිල ඉහළ යයි.
4. පාරිභෝගිකයා සාපේක්ෂව අඩු ඒකක බදු බරක් උසුලයි:
5. ඒකක බද්දේ බර බෙදීයාම නිශ්චිතවම දැක්විය නොහැක. (......)

08. වෙළඳපොලෙහි අලෙවි වන X නම් වූ භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය -1.25 ක් වේ නම් ඒ සඳහා වඩාත් සුදුසු භාණ්ඩය කුමක්ද?
1. මාළු
2. සන්ලයිට්
3. පළතුරු
4. එළවළු
5. සහල් (......)

09. එක්තරා භාණ්ඩයක සැපයුම්කරුවකුගේ සැපයුම් වක්‍රය Qs = -10 + 4P නම් හා භාණ්ඩයේ ඒකකයක වෙළඳ මිල රු.10 ක්ද වේ නම් නිෂ්පාදන අතිරික්තය
1. රු. 225.00
2. රු. 112.50
3. රු. 300.00
4. රු. 197.50
5. රු. 75.50 (......)

10. $Q_d = 20 - 4P$ සහ $Q_s = -10 + 2P$ යන පරිදි ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත සහිත භාණ්ඩයක මිල රු.5 සිට රු.3 දක්වා පහළ යාමත් සමඟ වෙළඳපොළ අධි ඉල්ලුම් ඒකක

1. 8
2. 4
3. 12
4. -4
5. -8

(......)

11. ඛනිජතෙල් සංස්ථාව ඛනිජ තෙල් පිරිපහදුවීම් සමඟ ගෑස් නිෂ්පාදනයත් සිදු වේ නම් ඛනිජ තෙල් මිල ඉහළ යන විට,

1. ඛනිජ තෙල් සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.
2. ඛනිජ තෙල් සැපයුම් වක්‍රය වමට විතැන් වේ.
3. ගෑස් සඳහා වන සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.
4. ගෑස් සඳහා වන සැපයුම් වක්‍රය වමට විතැන් වේ.
5. ගෑස් සැපයුම් වක්‍රය වමට විතැන් වේ.

(......)

12. නිපදවනු ලබන සෑම වී කිලෝවක් සඳහා ම රු. 5 ක සහනාධාරයක් ලබා දීමෙන් පසු වෙළඳපොළ ක්‍රියාකාරීත්වය පහත රූපසටහනින් දැක්වේ.




රජය වී ගොවීන් සඳහා ලබා දී ඇති සහනාධාරය ඉවත් කර ගැනීමට තීරණය කළේ නම්,

| පාරිභෝගික පැහැදම වෙනස් වීම | රාජ්‍ය වියදම අඩුවීම |
|---|---|
| රු. 7200 | රු. 8000 |
| රු. 3500 | රු. 3200 |
| රු. 7200 | රු. 4800 |
| රු. 5000 | රු. 5000 |
| රු. 3500 | රු. 8000 |

(......)

13. ආණ්ඩුව එක්තරා කෘෂිකාර්මික භෝගයක් සම්බන්ධයෙන් සහතික මිල ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරයි. ඊට අදාළ රූපසටහන පහත දැක්වේ.




රූපසටහනට අනුව මිල ආධාරක ප්‍රතිපත්තිය යටතේ රජයේ අතිරික්ත සැපයුම මිල දී ගැනීමේ වැඩපිළිවෙළ වෙනුවට ඌණ පූර්ණ ගෙවීම ක්‍රියාත්මක කළහොත් රජයේ වියදම කෙසේ වෙනස් වේද?

1. රු. 7 500/- කින් වැඩිවේ.
2. රු. 60 000/- කින් අඩුවේ.
3. රු. 60 000/- කින් වෙනස් වේ.
4. රු. 75 000/- කින් අඩුවේ.
5. වෙනසක් සිදු නොවේ.

(......)

14. උපරිම මිල ප්‍රතිපත්තියක් යටතේ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් පැවතිය හැකි වෙළඳපොළ අධි ඉල්ලුම ඉවත්කිරීමට නම්,
1. පාරිභෝගිකයන් මත අතිරේක බද්දක් පැනවිය යුතුය.
2. ගැනුම්කරුවන්ට මිල දී ගනු ලබන ප්‍රමාණයන් සීමාකර ගන්නා ලෙස දැනුවත් කළ යුතුය.
3. සල්ල සලාක ක්‍රමයක් මගින් අධි ඉල්ලුම ශුන්‍ය වන අයුරින් ඉල්ලුම් වක්‍රය වමට විතැන් කළ යුතුය.
4. වෙළඳ මිල සහ උපරිම මිල සමාන වන සේ පාරිභෝගිකයන්ට සහනාධාරයක් ලබා දිය යුතුය.
5. වෙළඳපොළට ප්‍රවේශවන සැපයුම්කරුවන් සංඛ්‍යාව ඉහළ නැංවිය යුතුය. (......)

15. කර්මාන්තයක් ඒකාධිකාරි තරඟයකට මුහුණ දෙන්නේ,
1. ගැනුම්කරුවන් කිහිපදෙනෙකු සිටින විටය.
2. සියලු ව්‍යාපාර ආයතන අධිලාභ ලබන විටය.
3. විකුණුම්කරුවන් වෙළෙඳපොළ කිහිපයකට මුහුණ දී ඇති විටය.
4. විවිධ ආයතන විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ අතර වෙනස්කම් පවතින විටය.
5. භාණ්ඩ සමජාතීය වන විටය. (......)

16. මෝටර් රථ 100 ක් නිපදවන විට මෝටර් රථයක සාමාන්‍ය මුළු පිරිවැය රු. 5000 කි. නිෂ්පාදනය මෝටර් රථ 101 ක් දක්වා වැඩිකිරීමේදී සාමාන්‍ය ස්ථාවර පිරිවැය රු. 10 කින් හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය රු. 10 කින් අඩුවේ. 101 වැනි මෝටර් රථය නිපදවීමේ ආන්තික පිරිවැය
1. රු. 10
2. රු. 20
3. රු. 2020
4. රු. 2980
5. රු. 4980 (......)

17. පූර්ණ තරඟකාරී ආයතනයක විවිධ නිමැවුම් මට්ටම්වලදී මුළු පිරිවැය පහත දැක්වේ.

| නිමැවුම | 0 | 10 | 20 | 30 | 40 | 50 |
|---|---|---|---|---|---|---|
| මුළු පිරිවැය (රු.) | 30 | 50 | 70 | 95 | 125 | 170 |

සාමාන්‍ය අයභාරය රු. 4 ක් වන්නේ නම් වඩා ලාභදායී වන්නේ කුමන නිෂ්පාදන මට්ටමද?
1. 10
2. 20
3. 30
4. 40
5. 50 (......)

18. ආයතනයක් බාහිර පිරිමැසුම් ලැබීමට හේතුවක් වන්නේ
1. ආයතනය තුළ ශ්‍රම විභජනය කිරීම.
2. ප්‍රචාරණ වියදම් වැඩිකිරීම.
3. නිෂ්පාදන පරිමාණය වැඩිකිරීම.
4. සේවක අභිප්‍රේරණය සඳහා කටයුතු කිරීම.
5. මාර්ග සංවර්ධනය නිසා ප්‍රවාහන පිරිවැය අඩු කිරීම. (......)

19. ආර්ථිකයේ සැබෑ නිමවුම විභව නිමවුම් මට්ටම ඉක්මවා යන විට හට ගන්නා නිමවුම් පරතරය හඳුන්වනුයේ,
1. ධන නිමවුම් පරතරය
2. ප්‍රතිගමනීය පරතරය
3. උද්ධමනීය පරතරය
4. ඍණ නිමවුම් පරතරය
5. විභව නිමවුම් පරතරය (......)

20. ජාතික ගිණුම්කරණයේදී සාමාන්‍ය නිෂ්පාදන ආයතනවලට ජාතික කරන ලද මිල ගණනක් වනුයේ මූලික මිලයි. මූලික මිල ගණනයේදී ඇතුළත් කර නොගනුයේ පහත සඳහන් ද අතුරෙන් කවරක්ද?
1. ආයතනයේ සේවක සංඛ්‍යාව මත ලබාදෙන සහනාධාර
2. විදේශ සංචාර හා දේපළ... ආනයන බදු
3. නිෂ්පාදිතය මත අයකරන බදු සහ පුද්ගල වියදම්
4. ව්‍යාපාරික හා වෘත්තීය බලපත්‍ර ගාස්තු
5. පරිසර විශෝධන බදු (......)

21. කිසියම් රටක කාලච්ඡේද දෙකක් අතර පවත්නා මිල යටතේ දේශීය නිෂ්පාදිතය 8% කට ආසන්න ප්‍රමාණයකින් ඉහළ ගිය නමුදු, මූර්ත දළ දේශීය නිෂ්පාදිතය එම කාලච්ඡේදය තුළ 4% පහළ වැටුණු බව සලකන්න. පහත සඳහන් කවර පැහැදිලි කිරීමක් මේ සඳහා වඩාත් යෝග්‍ය වේද?
1. 6% පොදු මිල මට්ටම ඉහළ නැගීම
2. 12% පොදු මිල මට්ටම පහළ වැටීම
3. 8% කින් පොදු මිල මට්ටම ඉහළ නැගීම
4. 12% පොදුමිල මට්ටම ඉහළ නැගීම
5. 8% කින් පොදු මිල මට්ටම පහළ වැටීම. (......)

24. කල්පිත ආර්ථිකයට අදාළ ඉහත රූප සටහනේ $Y_F$ පූර්ණ සේවා නියුක්ති මට්ටම ද $Y_1$ පවත්නා තිමවුම් මට්ටමත් නිරූපණය කරයි පවත්නා තත්ත්වය යටතේ ආර්ථිකය තුළ පවතී යැයි නිගමනය කළ හැක්කේ කවරක්ද?




1. අධි ඉල්ලුම් තත්ත්වයක්
2. ප්‍රතිගමනාත්මක පරතරයක්
3. රාජ්‍ය අයවැය හිඟය
4. සම්පත් අධි උපයෝජන මට්ටම
5. ගෙවුම් ශේෂයේ අතිරික්තය

25. රාජ්‍ය අංශයක් නොමැති ආර්ථිකයක පරිභෝජනය (C), ආයෝජනය (I), අපනයන (X) සහ ආනයන (M) අගයන් පහත දැක්වේ.

$C = 200 + 0.8Y$ $\quad I = 600$ $\quad X = 150$ $\quad M = 100$ (......)

මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම (y) කොපමණද?

1. 4250 2. 3000 3. 3250 4. 4000 5. 4500 (......)

26. ආර්ථිකයේ සමස්ත මිල මට්ටමෙහි පවත්නා අඛණ්ඩ ඉහළයාමක් උද්ධමනය ලෙස හැඳින්විය හැකිය. උද්ධමනය ඇති වීමට හේතුවක් වනුයේ පහත දැ අතරින් කවරක් ද?
1. රජය මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම ඉහළ දැමීම
2. යෙදවුම් මිල ගණන් ඉහළ යාම නිසා නිෂ්පාදන පිරිවැය වැඩිවීම
3. රජය යටිතල පහසුකම් වෙනුවෙන් දරන වියදම වැඩි වීම
4. ඩොලරයක රුපියල් වටිනාකම ක්ෂය වීම
5. විශ්‍රාම අනුපාතිකය ඉහළ යාම (......)

27. මුදල් සඳහා වන ගනුදෙනු ඉල්ලුම, ඉතා කිට්ටුවෙන් බැඳී පවත්නා මුදලේ කාර්යය වනුයේ,
1. වටිනාකම් සන්නිධියක් වීමය
2. විලම්භිත ගෙවුම් මාධ්‍යයක් වීමය
3. ගිණුම් ඒකකයක් ලෙස ක්‍රියාකිරීම
4. හුවමාරු මාධ්‍යයක් වීමය
5. වටිනාකම පිළිබඳ මිනුමක් වීම ය (......)

28. පහත සඳහන් වත්කම් අතුරෙන් වඩාත් ද්‍රවශීල වත්කමක් වනුයේ කවරක්ද?

1. භාණ්ඩාගාර බිල්පත්
2. ඉල්ලුම් තැන්පතු
3. ඉතුරුම් තැන්පතු
4. ස්ථිර තැන්පතු
5. භාණ්ඩාගාර බැඳුම්කර

(......)

29. මහ බැංකුව විසින් වාණිජ බැංකු වලින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගන්නේ නම් මුදල් සැපයුමට සහ වාණිජ බැංකු සංචිතවලට කුමක් සිදුවෙයිද?

| මුදල් සැපයුම | බැංකු සංචිත |
|---|---|
| අඩුවේ | වෙනස් නොවේ |
| වැඩිවේ | අඩුවේ |
| වැඩිවේ | වැඩිවෙ |
| වැඩිවේ | වෙනස් නොවේ |
| අඩුවේ | වැඩිවේ |

(......)

30. මහ බැංකුව රජයට සපයන ශුද්ධ ණය ප්‍රමාණය ඉහළ යාමක ප්‍රතිඵලයක් වනුයේ,

1. රජයේ තැන්පතු පහළ වැටීම
2. පෞද්ගලික අංශයට ලබාගත හැකි සම්පත් ප්‍රමාණය අඩුවීම
3. පදනම් මුදල් සැපයුම ඉහළ යාම
4. පොලී අනුපාත ව්‍යුහය ඉහළ යාම
5. වාණිජ බැංකු ණය ප්‍රසාරණය පහත වැටීම

(......)

31. යම් පුද්ගලයෙකු තම වාණිජ බැංකු තැන්පතු ගිනුමෙන් රු.20000 ක් ආපසු ගනු ලැබේ යැයි සලකන්න. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය 10% වේ නම් සහ අනෙකුත් කරුණු කිසිවක් නොවෙනස්ව පවතී නම් මෙම ගනුදෙනුව නිසා සෘජුවම,

1. බැංකු තැන්පතු රු.පි. 18000 කින් අඩු වේ.
2. මුදල් සැපයුම රු.පි. 18000 කින් අඩු වේ.
3. මුදල් සැපයුම රු.පි. 20000 කින් අඩු වේ.
4. බැංකු තැන්පතු රු.පි. 20000 කින් අඩු වේ.
5. මුදල් සැපයුම රු.පි. 20000 කින් අඩුවන අතර බැංකු තැන්පතු රු.පි.18000 කින් අඩු වේ. (......)

32. පරිභෝජනයේ තරගකාරීත්වයක් නොතිබීම, ගෙවීමක් නොකරන අයට පරිභෝජනය සීමා කළ නොහැකි වීම හා ඒවායින් ලැබෙන ප්‍රතිලාභ ලොව පුරා සිටින පුද්ගලයින්ට භුක්ති විඳිය හැකි වීම යන ලක්ෂණ දැකිය හැකි වන්නේ,

1. ගෝලීය ශුද්ධ පොදු භාණ්ඩ වලය
2. ගෝලීය පෞද්ගලික භාණ්ඩ වලය
3. ගෝලීය අර්ධ පොදු භාණ්ඩ වලය
4. ගෝලීය පොදු සම්පත් වලය
5. ගෝලීය පොදු භාණ්ඩ වලය

(......)

33. පහත දැක්වෙන භාණ්ඩ අතරින් ආර්ථික භාණ්ඩයක් නොවන්නේ,

1. අවගුණ භාණ්ඩ
2. සුබසාධන භාණ්ඩ
3. නිව භාණ්ඩ
4. පෞද්ගලික භාණ්ඩ
5. බාල භාණ්ඩ

(......)

34. කිසියම් විශේෂිත භාණ්ඩයක් සඳහා අදාල ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ (MPB) සහ ආන්තික සමාජ ප්‍රතිලාභ වක්‍රත්, වෙළඳ පොළ සැපයුම් වක්‍රයත් (S) පහත රූප සටහනේ දැක්වේ.




මෙම වෙළෙඳ පොළට ආණ්ඩුවේ මැදිහත්වීමක් නොතිබුණහොත් සම්පත් බෙදා වෙන් කිරීමේ අකාර්යක්ෂමතාවක් හටගැනීමට ඉඩ ඇත. මක්නිසාදයත්,
1. නිදහස් වෙළඳ පොළෙහි මිල ඉතා පහළ මට්ටමක පැවතීමය
2. A – B ප්‍රමාණයෙන් භාණ්ඩයේ අධි නිෂ්පාදනයක් හට ගැනීම නිසාය
3. පරිභෝජනයේ සෘණ බාහිරතාවක් පැවතීම නිසාය
4. A – B ප්‍රමාණයෙන් එම භාණ්ඩයේ ඌණ පරිභෝජනයක් හට ගැනීම නිසාය
5. පරිභෝජනය ධන බාහිරතාවක් පැවතීම නිසාය (......)

35. පෞද්ගලිකරණයේ සමාජයීය ප්‍රතිලාභයක් නොවන්නේ,
1. කාර්යක්ෂමතාව ඉහළ යාම.
2. දේශපාලන බලපෑම්වලින් තොරව ස්වාධීන තීරණ ගත හැකි වීම.
3. තරගයට විවෘත වීම.
4. ආණ්ඩුවේ අය-වැය හිඟය අඩු කරගැනීමට පිටිවහලක් වීම.
5. ආයෝජන ප්‍රස්තා සීමා වීම. (......)

36. බදු අය කිරීම තුළින් ආණ්ඩුව විසින් අපේක්ෂා කරනු ලබන අරමුණක් නොවන්නේ,
1. කාර්යක්ෂමව සම්පත් කළමනාකරණය කිරීමට.
2. මිනිසුන් බැංකු ණය ගැනීම සීමා කිරීමට.
3. ආදායම් හා ධනය බෙදී යාමේ විෂමතාව අවම කිරීමට.
4. අවගුණ භාණ්ඩ පරිභෝජනය අධෛර්යමත් කිරීමට.
5. ආණ්ඩුවේ වියදම් පියවා ගැනීමට. (......)

37. පැය 70 ක් ද, තේ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා පැය 140 ක්ද වැය වේ. භූතානයේ ඇගලුම් ඒකකයක් නිශ්පාදනය කිරීම සඳහා ශ්‍රම පැය 280 ක් ද, තේ ඒකකයක් නිශ්පාදනය කිරීම සඳහා ශ්‍රම පැය 280 ක් ද වේ. මෙම තත්වය සඳහා පහත සඳහන් කවර ප්‍රකාශයක් නිවැරදි වේද?
1. ඇගලුම් නිෂ්පාදනය සඳහා භූතානයට සාපේක්ෂ වාසි පවතී.
2. තේ නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකාවට සාපේක්ෂ වාසි පවතී.
3. ඇගලුම් නිෂ්පාදනය සඳහා භූතානයට නිරපේක්ෂ වාසි පවතින අතර තේ නිශ්පාදනය සඳහා ශ්‍රී ලංකාවට සාපේක්ෂ වාසි පවතී.
4. ශ්‍රී ලංකාව හා භූතානය යන දෙකම තේ නිෂ්පාදනය කළ යුතුය.
5. ඇගලුම් නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකාවට සාපේක්ෂ වාසි පවතී. (......)

38. රටක භාණ්ඩ වෙළඳ අනුපාතය ගණනය කිරීමට යොදාගනු ලබන සූත්‍රය කුමක්ද?

1. $\frac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$

2. $\frac{\text{ආනයන මිල දර්ශකය}}{\text{අපනයන මිල දර්ශකය}} \times 100$

3. $\frac{\text{අපනයන පරිමා දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$

4. $\frac{\text{අපනයන මිල දර්ශකය - ආනයන මිල දර්ශකය}}{\text{අපනයන පරිමා දර්ශකය}} \times 100$

5. (ආනයන මිල දර්ශකය - අපනයන මිල දර්ශකය) x 100 (......)

39. ගෙවුම් තුලන ශේෂ්ඨයෙහි ඇති ගිණුම් වර්ග අතුරෙන් එක් ගිණුමක් වනුයේ ජංගම ගිණුමයි. ජංගම ගිණුමේ ඇති උප ගිණුමක් වන ද්විතියික ආදායම් ගිණුමට අයත් සංක්‍රාම ස්වරූප දෙක වනුයේ
1. පෞද්ගලික වර්තන සංක්‍රම හා රාජ්‍ය වර්තන සංක්‍රාම
2. නිල වර්තන සංක්‍රාම හා ශුද්ධ වර්තන සංක්‍රාම
3. පෞද්ගලික වර්තන සංක්‍රාම හා නිල වර්තන සංක්‍රාම
4. පෞද්ගලික වර්තන සංක්‍රාම හා ශුද්ධ වර්තන සංක්‍රාම
5. රාජ්‍ය වර්තන සංක්‍රාම හා ශුද්ධ වර්තන සංක්‍රාම (......)

40. රටවල් දෙකක් අතර මුදල්වල හුවමාරු අනුපාතිකය හඳුන්වනු ලබන්නේ
1. නාමික සඵල විනිමය අනුපාතිකය
2. නාමික විනිමය අනුපාතිකය
3. සඵල විනිමය අනුපාතිකය
4. මූර්ත විනිමය අනුපාතිකය
5. මූර්ත සඵල විනිමය අනුපාතිකය (......)

41. වර්තමානයේ ශ්‍රී ලංකාවේ අපනයන වල ප්‍රධාන දිශානතිව හා ආනයන වල ප්‍රධාන මූලාශ්‍රය වනුයේ පිළිවෙලින්
1. ඇමෙරිකා එක්සත් ජනපදය හා ඉන්දියාවයි.
2. එක්සත් රාජධානිය හා චීනයයි.
3. ඉන්දියාව හා චීනයයි.
4. ඇමෙරිකා එක්සත් ජනපදය හා චීනයයි.
5. චීනය හා ඉන්දියාවයි. (......)

42. ආර්ථික සම්බාධක පැනවූ රටකට වෙනත් රටකින් බොහෝ දුරට ආනයනය කිරීමට ඉඩ ලබාදෙන භාණ්ඩය වනුයේ
1. ඖෂධ
2. පරිගණක
3. රෙදිපිළි
4. මෝටර් රථ
5. සුවඳ විලවුන් (......)

43. [illegible]

1. [illegible]
2. [illegible]
3. [illegible]
4. [illegible]
5. [illegible] (......)

44. [illegible] ආර්ථිකයක යැපුම් අනුපාතය 50% සිට 55% දක්වා වෙනස් වුණි නම් එයට බලපෑ හැකි හේතුව විය හැක්කේ

1. ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය පහළ යාම
2. සේවා නියුක්ත ජනගහනය ඉහළ යාම
3. වැඩිහිටි ජනගහනය ඉහළ යාම
4. සජීවී උපත් ප්‍රමාණය අඩුවීම
5. සේවා වියුක්ත ජනගහනය පහළ යාම (......)

45. 2019 - මානව සංවර්ධන දර්ශකයේ රටවල් 189 ක් අතරින් ශ්‍රී ලංකාවට හිමි ස්ථානය වනුයේ

1. 70  2. 71  3. 72  4. 74  5. 80 (......)

46. මහ බැංකු වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ වාර්ෂික සේවා වියුක්ත අනුපාතය වනුයේ

1. 4.8%  2. 5.1%  3. 4.9%  4. 4.4%  5. 4.5% (......)

47. ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2016 ට අනුව රටේ ජනගහන දරිද්‍රතා දර්ශකය වනුයේ

1. 4.0%
2. 3.8%
3. 3.9%
4. 4.2%
5. 4.1% (......)

48. පහත දක්වා ඇති මිනුම් අතරින් ආදායම් ව්‍යාප්තියේ විෂමතාවය මැනීමට යොදා ගනුයේ

1. ජාතික දරිද්‍රතා රේඛාවකි.
2. ගිනි සංගුණකයයි
3. විභිනතා සංගුණකයයි
4. ජාත්‍යන්තර දරිද්‍රතා මට්ටමයි
5. ප්‍රතිශීර්ෂ ආදායමයි (......)

49. රටවල් මැදි ආදායම් උගුලට හසු වීමට බලපාන සාධක අතරින් ප්‍රධාන වශයෙන්ම හේතු විය නොහැක්කේ

1. වැඩි නවෝත්පාදන මට්ටම
2. ශ්‍රම වෙළඳපොල දාඩතා
3. අඩු ආර්ථික විවිධාංගීකරණය
4. දියුණු යටිතල පහසුකම් නොමැතිවීම
5. ශක්තිමත් ආයතන නොපැවතීම (......)

50. ශ්‍රී ලංකාව තවදුරටත් ලොව්පුරා වැඩිම ස්ත්‍රී පුරුෂ ශ්‍රම බලකා සහභාගීත්ව පරතරයක් ඇති රටවල් 20 අතරේ රැඳී සිටීමට බලපාන ප්‍රධානතම හේතුව

1. ශ්‍රී ලාංකික ස්ත්‍රීන්ගේ අධ්‍යාපන මට්ටම පුරුෂයන්ට වඩා පහළ මට්ටමක පැවතීම
2. විද්‍යාව ගණිතය තාක්ෂණ ආශ්‍රිත අධ්‍යාපනය සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය ඉහළ මට්ටමක පැවතීම
3. උසස් අධ්‍යාපන ආයතනවලින් සුදුසුකම් ලබා ඇති කාන්තාවන්ගෙන් බහුතරය වාණිජ විෂය ධාරාවෙන් උපාධිය ලබා තිබීම
4. පරිගණක විද්‍යා ඉංජිනේරු විද්‍යාව හා තාක්ෂණ අංශවලින් අධ්‍යාපනය ලැබූ කාන්තාවන් ප්‍රතිශතය ඉතා පහළ මට්ටමක පැවතීම
5. ශ්‍රී ලාංකික පුරුෂයන්ට වඩා ස්ත්‍රීන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ මට්ටමක පැවතීම. (......)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights

# දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
# DEVI BALIKA VIDYALAYA - COLOMBO
## III වාර පරීක්ෂණය - 2021 දෙසැම්බර්
## 13 ශ්‍රේණිය

Manasa Sanyutha Dheera

ආර්ථික විද්‍යාව II
Economics II

21 S II

පැය තුනයි
Three hours

- උපදෙස් : "අ" උපකොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, "ආ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගන්න. ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

### "අ" උප කොටස
(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගන්න)

01. i) හිඟකම යන්න වුවමනාවන් මත තීරණය වන්නකි. මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 04)

ii) නිදහස් වෙළඳපොල ආර්ථික ක්‍රමයක් තුළ ආණ්ඩුවේ මැදිහත්වීම සාධාරණීකරණය කළ හැකි හේතු කවරේද? (ලකුණු 04)

iii) භාණ්ඩයක් යන්න හඳුන්වන්න. සෑම භාණ්ඩයක්ම නිෂ්පාදන සම්පතක් ලෙස හඳුනාගත හැකිද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv) ආවස්ථික පිරිවැය ඉහළ නංවමින් නිෂ්පාදන හැකියා වක්‍රය පිටතට නෙරා යෑමකට බලපෑ හැකි සාධක මොනවාද? (ලකුණු 04)

v) ආර්ථික පසුබැසීම හා ආර්ථික අවපාතය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

02. i) ඉල්ලුම් නීතිය සඳහා පදනම් වන උපකල්පන කවරේද? (ලකුණු 04)

ii) කිසියම් භාණ්ඩයක -හෝ සේවාවක සැපයුම ස්ථාවරයැයි ද පවත්නා මිල යටතේ අධි ඉල්ලුමක් පවතී යැයි ද සිතන්න.

අ) ඉහත තත්ත්වය රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ) ස්ථාවර සැපයුම ඉල්ලුම්කරුවන් අතර බෙදා හැරිය හැකි විකල්ප ක්‍රම නම් කරන්න. (ලකුණු 04)

iii) ඍජු ඉල්ලුම හා ව්‍යුත්පන්න ඉල්ලුම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv) වෙළෙඳපොළ සමීක්ෂණයක දී X භාණ්ඩයට ඇති ඉල්ලුම පිළිබඳව පහත තොරතුරු ඔබට සපයා ඇත.

A - X භාණ්ඩයේ මිල 25% කින් වැඩි වන විට X භාණ්ඩයෙන් අලෙවි වන ප්‍රමාණය 5% කින් අඩුවේ.

B - පාරිභෝගික ආදායම 4% කින් වැඩිවන විට X භාණ්ඩයෙන් අලෙවි වන ප්‍රමාණය 8% කින් වැඩි වේ.

C - Y භාණ්ඩයේ මිල 1% වැඩි වන විට X භාණ්ඩයෙන් අලෙවි වන ප්‍රමාණය 5% කින් අඩුවේ.

(අ) X භාණ්ඩයේ ආදායම් ඉල්ලුම් නම්‍යතාව කොපමණද? ඒ අනුව කවර භාණ්ඩයක්ද? (ලකුණු 02)

(ආ) X භාණ්ඩයෙහි මිල ඉල්ලුම් නම්‍යතාව කොපමණද? ඒ අනුව කවර ඉල්ලුමක් පවතී ද? (ලකුණු 02)

(ඉ) Y භාණ්ඩයට සාපේක්ෂව X භාණ්ඩයෙහි හරස් මිල ඉල්ලුම් නම්‍යතාවය කොපමණද? ඒ අනුව කවර භාණ්ඩ යුගලයක් ද? (ලකුණු (02)

03. i) "සාධක විකිණීමෙන් ලැබෙන ඉපයීම් තුළ අන්තර්ගත ආර්ථික බදු කුලී ප්‍රමාණය සාධක සැපයුම් නම්‍යතාව මත තීරණය වේ." මෙම ප්‍රකාශය විග්‍රහ කරන්න. (ලකුණු 04)

ii) වෙළඳපොලෙහි අලෙවි වන බාස්මති සහල් 1 kg ක් විකිණිය හැකි උපරිම මිල රුපියල් 90.00 ක් ලෙස රජය නියම කරන ලදී. අදාල සහල් වර්ගය යනු මුළුමනින්ම දේශීයව නිපදවන භාණ්ඩයක් යැයි සලකා මෙම තීරණයේ ආර්ථික ප්‍රතිවිපාක රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii) එක්තරා භාණ්ඩයක් සම්බන්ධයෙන් ඉල්ලුම් සහ සැපයුම් ලේඛනයන් පහත දක්වා තිබේ. ඒ ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 10 | 300 | -200 |
| 20 | 200 | -100 |

(අ) ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ගොඩනගන්න. (ලකුණු 02)
(ආ) සමතුලිතයේදී ආර්ථික අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 02)
(ඇ) සමතුලිතයේදී මිල ඉල්ලුම් නම්‍යතාවය ගණනය කොට අර්ථ දක්වන්න. (ලකුණු 02)
(ඉ) ඉහත භාණ්ඩ මත රුපියල් 6ක බද්දක් පනවන්නේ නම්,
a. බද්දෙන් පසු සමතුලිත මිල හා ප්‍රමාණය (ලකුණු (02)
b. බද්ද නිසා පාරිභෝගිකයාට අහිමි වන ප්‍රමාණය (ලකුණු (02)
c. රජයේ බදු ආදායම

iv) සහනාධාරයේ මුළු වාසිය ම පාරිභෝගිකයා විසින් දරන අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු (02)

04. i) කෙටි කාලීන හා දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලියන්හි යෙදවුම් සමග නිමැවුම් හැසිරීමට පදනම් වන නියමයන් කවරේද? (ලකුණු 04)

ii) එකක් රුපියල් 12 බැගින් පූර්ණ තරගකාරී ආයතනයක් බිත්තර 500 ක් සතියකදී අලෙවි කරයි. මෙම නිමැවුම සඳහා ආයතනය දරන මුළු විචල්‍යය පිරිවැය 2000 ක් වන අතර මුල ස්ථාවර පිරිවැය රුපියල් 800 කි. ආයතනය සතියකදී උපයන මුළු ලාභය හා ඒකකයකට ලැබෙන ලාභය ගණනය කරන්න. (ලකුණු 04)

iii) ඒකාධිකාරයේ ප්‍රවේශයන්ට ඇති බාධාවන් කවරේද? (ලකුණු (04)

iv) පූර්ණ තරගකාරී කර්මාන්තයක් තුළ කටයුතු කරන එක් ආයතනයක් පිළිබඳ රූප සටහන් පහත දැක්වේ.



(අ) ආයතනයට ලැබෙන මිල රුපියල් 45ක් නම් නිශ්පාදනයේ යෙදී සිටීමට ප්‍රමාණවත් ලාභයක් ලැබේ ද? එසේ ලැබෙන ලාභය ගණනය කරන්න. (ලකුණු 02)

(ආ) ආයතනය ආර්ථික ලාභ උපයන්නේ නම් ලැබිය යුතු මිල කීයද? එහිදී උපයන ආර්ථික ලාභයේ ප්‍රමාණය සොයන්න. (ලකුණු 02)

(ඇ) මෙම ආයතනය වසා දැමීමට තීරණය කළහොත් එම අවස්ථාවේදී ආයතනයට දැරීමට වන අලාභය කොපමණද? (ලකුණු 02)

(ඈ) මෙම පූර්ණ තරගකාරී ආයතනයේ සැපයුම් වක්‍රය සඳහා ලේඛනයක් සකස් කරන්න. (ලකුණු 02)

05\. i) කිසියම් වර්ෂයක් තුළ සිදු වූ පහත දැක්වෙන එක් එක් ක්‍රියා එම වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් වේද නොවේද යන්න සඳහන් කරන්න.

a) පවුලක් තම පරිභෝජනයට අවශ්‍ය එළවළු තම ගෙවත්තේ වගා කර ගැනීම.

b) ආයෝජකයකු විසින් ප්‍රධාන වාණිජ බැංකුවක රුපියල් මිලියන 50 ක් වටිනා කොටස් මිලදී ගැනීම.

c) ඛනිජ සම්පත් ගවේෂණය කිරීම වෙනුවෙන් පර්යේෂණ ආයතනයකට කරන ලද ගෙවීම.

d) විදේශයක නිපදවන ලද රුපියල් මිලියන 5 ක් වටිනා පලතුරු තොගයක් සංචාරක හෝටලයක් විසින් මිලදී ගැනීම. (ලකුණු 04)

ii) කල්පිත ආර්ථිකයක් සඳහා ජාතික ආදායම් ගිණුම් දත්ත කිහිපයක් පහත දැක්වේ.(සියලුම සංඛ්‍යා රුපියල් බිලියන වලිනි)

| අයිතමය | වටිනාකම |
|---|---|
| ශුද්ධ ආයෝජන | 600 |
| ආණ්ඩුවේ මිලදී ගැනීම් | 3000 |
| පරිභෝජන වියදම් | 12000 |
| ක්ෂය වීම් | 600 |
| අපනයන | 600 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | 60 |
| වක්‍ර බදු | 150 |
| සංක්‍රාම ගෙවීම් | 240 |
| ආනයන | 300 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

a. වෙළඳපොල මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය

b. වෙළඳපල මිල යටතේ දළ ජාතික ආදායම

c. ශුද්ධ ජාතික ආදායම (ලකුණු 06)

iii) ජාතික ගිණුම් දත්ත ආර්ථික විශ්ලේෂණ කටයුතු සඳහා යොදා ගැනෙන ප්‍රබල උපකරණයකි. හේතු දක්වන්න. (ලකුණු 02)

iv) ස්වාධීන වියදම් සහ පෙළඹුම වියදම් යනු මොනවාදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු (04)

v) රාජ්‍ය අංශය සහිත එක්තරා සංවෘත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $C = 1200 + 0.8yd$ වේ. ආණ්ඩුව රාජ්‍යය වියදම් තවත් රුපියල් මිලියන 160 කින් ද ස්ථාවර බදු රුපියල් මිලියන 160 කින් ද වැඩි කිරීමට තීරණය කරන ලදී.

a) රාජ්‍ය වියදම් වැඩිවීමේ ප්‍රසාරණාත්මක බලපෑම සොයන්න.

b) ස්ථාවර බදු ඉහළ යාමේ සංකෝචනාත්මක බලපෑම සොයන්න.

c) ඉහත සිදුවීම් දෙක නිසා ජාතික ආදායමට ඇති කරන ශුද්ධ බලපෑම දක්වන්න.

"ආ" ලප කොටස

**මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගන්න.**

06. i) මතුපිට උද්ධමනය සහ මූලික උද්ධමනය යනු එකිනෙකට සමාන සංකල්ප දෙකකි. පහදන්න. (ලකුණු 04)

ii) මුදල් ප්‍රමාණවාදය සහ විනිමය සමීකරණය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii) කල්පිත ආර්ථිකයක මුළු මුදල් සැපයුම රුපියල් බිලියන 6000 ක් වන අතර වාණිජ බැංකු සතු මුළු තැන්පතු ප්‍රමාණය රුපියල් බිලියන 5000 කි. මහ බැංකුව නියම කර ඇති සංචිත අනුපාතය 10% නම් මුදල් ගුණකය ගණනය කරන්න. (ලකුණු 02)

iv) කල්පිත ආර්ථිකයක වාණිජ බැංකු පද්ධතියේ ඒකාබද්ධ ශේෂ පත්‍රය පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 3600 | මුදල් | 200 |
| කොටස් ප්‍රාග්ධනය | 4000 | මහ බැංකුවේ තැන්පතු | 400 |
| අනෙකුත් වගකීම් | 3000 | සුරැකුම්පත් | 4000 |
| | | ණය හා අත්තිකාරම් | 600 |
| | 10600 | | 10600 |

a) බැංකු පද්ධතිය සතුව අධි සංචිත තිබේද? කොපමණද?

b) බැංකු පද්ධතියට කොතරම් ප්‍රමාණයක් අලුතින් ණය වශයෙන් සැපයිය හැකිද?

c) ණය ප්‍රසාරණයෙන් පසු බැංකු පද්ධතියේ නව ශේෂ පත්‍රය පෙන්වන්න.

d) මහ බැංකුව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20% දක්වා වැඩි කලේ නම් බැංකු පද්ධතියේ නව ශේෂ පත්‍රය පෙන්වන්න.(වාණිජ බැංකු අධි සංචිත පවත්වා නොගනී)

e) මහ බැංකුව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 5% දක්වා පහත හෙළුවේ නම් බැංකු පද්ධතියේ නව ශේෂ පත්‍රය පෙන්වන්න. (ලකුණු 10)

07. i) පොදු භාණ්ඩ යනු කවරේද? එබඳු භාණ්ඩ වෙළඳපොල මගින් පහසුවෙන් සැපයිය නොහැක්කේ මන්ද? (ලකුණු 04)

ii) ප්‍රස්ථාර සටහන් යොදාගනිමින් නිෂ්පාදනයේ ධන බාහිරතාවක් සහ සෘණ බාහිරතාවක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii) බද්දක් මගින් මධ්‍යස්ථ බව උල්ලංඝනය වන විට ඇතිවන ආර්ථික ප්‍රතිවිපාක කවරේද? (ලකුණු 04)

iv) කිසියම් කල්පිත ආර්ථිකයක ඉදිරි වර්ෂයකට අදාලව ඇස්තමේන්තුගත රාජ්‍ය මූල්‍ය තොරතුරු කිපයක් පහත දැක්වේ. සියලු සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

| | |
|---|---|
| දළ දේශීය නිෂ්පාදනය | 1 500 000 |
| පුනරාවර්තන වියදම් | 300 000 |
| ප්‍රාග්ධන වියදම් | 150 000 |
| ශුද්ධ ණයදීම | 60 000 |
| බදු ආදායම | 204 000 |
| බදු නොවන ආදායම | 66 000 |
| ණය වාරික ආපසු ගෙවීම | 90 000 |
| ප්‍රදාන | 60 000 |
| ණය පොලී ගෙවීම | 30 000 |

ඉදිරි වර්ෂය සඳහා ඇස්තමේන්තුගත පහත සඳහන් දෑ ගණනය කරන්න.

a) වර්තන ගිණුම් ශේෂය

b) සමස්ත අයවැය ශේෂය

c) ප්‍රාථමික ගිණුමේ ශේෂය සොයා එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න. (ලකුණු 06)

v) රාජ්‍ය ණය ඉහළයාමේ ආර්ථික ප්‍රතිවිපාක මොනවාද? (ලකුණු 02)

08. i) ජාත්‍යන්තර වෙළෙඳාම හා [illegible] සහ ආර්ථිකය අතර සම්බන්ධය පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii) සංයුක්ත සම්පත් ඒකකයකින් ශ්‍රී ලංකාව සහ ජපානය යන රටවල උපරිම වශයෙන් නිපදවිය හැකි සහල් සහ මෝටර් රථ ඒකක ප්‍රමාණ පහත දැක්වේ.

| රට | සහල් | මෝටර් රථ |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 240 | 180 |
| ජපානය | 180 | 180 |

a) එක් එක් රටට විශේෂ ප්‍රාගුණ්‍යය කළ යුත්තේ කවර භාණ්ඩයක් ද?

b) හුවමාරු අනුපාතය කවර පරාසයක් තුළ තීරණය වේද? (ලකුණු 04)

iii) 'මූර්ත විනිමය අනුපාතය' පැහැදිලි කර එය තීරණය වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv) ශ්‍රී ලංකාවේ අපනයන අංශය මුහුණ දී සිටින අභියෝග කවරේද? (ලකුණු 04)

v) පහත සඳහන් දෑ ගෙවුම් තුලන ලේඛනයේ සටහන් කෙරේදැයි දක්වා ඊට අදාළ ද්විත්ව සටහන ලියන්න.

a) නුවරඑළියේ අක්කරයක භූමි භාගයක් හෝටල් සංකීර්ණයක් ඉදිකිරීමට විදේශ සමාගමකට ඇමරිකානු ඩොලර් මිලියන 500 කට අලෙවි කිරීම.

b) ජාත්‍යන්තර අරමුදල විසින් මහාමාර්ග සංවර්ධනය සඳහා ලබාදුන් ණය මුදලින් ඇමරිකානු ඩොලර් මිලියන 50ක් කපාහැරීම.

c) මැද පෙරදිග සේවය කරන ශ්‍රී ලාංකික ගෘහසේවිකාවක්, ඩොලර් 2000ක මුදලක් ලංකාවේ තම පවුලට එවීම.

d) විදේශිකයකු ජේමාස් සමූහ ව්‍යාපාරයේ කොටස් මිලදී ගැනීම. (ලකුණු 04)

09. i) "තුලිත සංවර්ධනයක්" යනු කුමක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii) ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය මිනිස් ජීවිතයේ ගුණාත්මක තත්ත්වය උසස් කිරීමට කෙසේ වෙනස් විය යුතුද? පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii) පරිසරය හා ආර්ථික වර්ධනය අතර තුලනය පවත්වා ගැනීමේ අරමුණින් පරිසරය සංරක්ෂණය කිරීම හා ආපදා අවම කිරීම සඳහා රජය ගත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 05)

iv) ශ්‍රී ලංකාවේ ආයෝජන ප්‍රවර්ධනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු 05)

10. i) "ගිග් ආර්ථිකය" (gig economy) යන්න හඳුන්වා ගිග් ක්‍රියාකාරකම් සඳහා උදාහරණ සපයන්න. (ලකුණු 05)

ii) දීර්ඝ කාලයක් මුළුල්ලේ ඉහළ ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවට නොහැකි වුවද දැනටමත් ශ්‍රී ලංකාව සතු ශක්තීන් පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 05)

iii) කොවිඩ් 19 වසංගතය තුළින් ශ්‍රී ලංකාවට ඇති කරන බලපෑම අවම කිරීම සඳහා ක්‍රියාත්මක වන මූලික ප්‍රතිපත්ති 03 කවරේද? (ලකුණු 05)

iv) කොවිඩ් 19 වසංගතය පැතිර යාම හා එය පාලනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග නිසා අපහසුතාවයට පත්වන ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා පහසුකම් සැලසීමට මූල්‍ය අංශය ගනු ලබන පියවර මොනවාද? (ලකුණු 05)